දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிறிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) 01(10)/30/2013
My No : )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2014.01. 28
Date : )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

ශ්‍රී ලංකා ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
ශික්ෂණ රෝහල්/මහ රෝහල්/ අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීන්,
ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>හෙද / හෙදි නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2013</u>**

ඔබ ආයතනයේ සේවය කරන මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් හෙද / හෙදි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ගන්නා ලද තීරණය අදාල නිලධාරියාගේ නමට ඉදිරියෙන් දක්වා ඇත.ඒ අනුව නිර්දේශය ලෙස "අනුමත වී ඇත" යන්න සඳහන් වන නිලධාරින්ගේ ස්ථාන මාරු 2014.01.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි මින් නියෝග කරමි.

02. පළාත් සභා සඳහා ස්ථාන මාරු නියෝග ලබා ඇති හෙද / හෙදි නිලධාරින් ඒ සඳහා මුදාහල යුත්තේ අදාල පළාත් සභා එකඟතාවය ලද පසුය.මේ වනවිට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, අදාල පළාත් එකඟතා මෙම අමාත්‍යාංශයට ලැබී ඔබ වෙත නිල වශයෙන් දන්වන තුරු එම නිලධාරින් මුදා හැරීමට කටයුතු නොකරන ලෙසද දන්වා සිටිමි.

03. 2013.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ අවුරුදු 04 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ට වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට කටයුතු කර ඇති අතර මහරගම ජාතික පිළිකායතනය,ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය,අංගොඩ මූලික රෝහල (අයි.ඩී.එච්.) හා වැලිසර ළය රෝහල යන ආයතන වල වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන්ට වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට කටයුතු කර ඇත.

04. එසේම 2013.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 04 කට අඩු සේවා කාලයක් සපුරා තිබෙන නිලධාරීන්ගේ අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව ඔවුන් සඳහා ද තීරණ ලබා දීමට කටයුතු කර ඇත.

05. මෙහිදී සේවා කාලය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාල නිලධාරින්ගේ ස්ථාන මාරු අයඳුම්පත් වලින් බැවින් එම අයදුම්පත් වල සඳහන් තොරතුරු ව්‍යාජ/අසත්‍ය බව පසුව හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බවට දන්වා සිටින අතර එවැනි වැරදි තොරතුරු මත ලබාදෙන ලද ස්ථාන මාරු අවලංගු කිරීමට ද කටයුතු කෙරේ. එවැනි තොරතුරු මත ස්ථාන මාරු අයදුම්පත් සහතික කල හා නිර්දේශ කල නිලධාරින් ද ඒ සඳහා වගකිව යුතු වේ.

06. මෙම ස්ථානමාරු තීරණය සම්බන්ධව යම් නිලධාරියෙකු අභියාචනාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එම අභියාචනා 2014.02.21 දිනට ප්‍රථම ඔබගේ නිර්දේශ සමඟ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02 වෙත ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

07. රෝහල් වල සේවා සැපයීම අඩාල් නොවන සේ මාරුවීම් සඳහා නිලධාරීන් මුදාහැරීම සිදුකල යුතු අතර ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධරයාට ප්‍රමුඛතාවය දෙන ආකාරයෙන් නිදහස් කිරීම යෝග්‍ය වේ.ආයතනයන්ට අදාල නවක කාර්ය මණ්ඩල සඳහා 2013.12.31 දිනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී ඇති බැවින් එම අනුමත සංඛ්‍යාවට අනුකූලව ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යන ලෙස මෙයින් ඔබට දැනුම් දෙමි.

08. මේ සම්බන්ධව ඔබ ආයතනයේ අදාල සියළු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
''සුවසිරිපාය''
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.